රුහුණ විශ්වවිද්‍යාලය

**2016/2017 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/ විශේෂ) උපාධි - 3000 ස්ථලය**
**දෙවන සමාසික පරීක්ෂණය - 2018 මැයි**

**SLS 3202 – නූතන සිංහල ගද්‍ය සාහිත්‍යය**

**<u>එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් (02) තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>**

අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කෙරේ.

**කාලය : පැය 03 යි.**

---

## <u>'අ' කොටස</u>

01. "මුල්කාලීන සිංහල ප්‍රබන්ධකථාවල දැක්වෙන සාමයික වාද විවාද සමකාලීන සමාජ පිලිබිඹුවකි." නිදසුන් සහිත ව සාකච්ඡා කරන්න.

02. සයිමන් ද සිල්වා, සිංහල නවකථාව පිළිබඳ ව තැබූ සාධනීය ප්‍රගතිශීලී පියවර පියදාස සිරිසේනයන්ගේ නිර්මාණ මගින් විසිරී ගිය ආකාරය සනිදර්ශන ව පහදන්න.

03. පියදාස සිරිසේනයන් විසින් රචිත ප්‍රබන්ධකථා, විචාර ක්ෂේත්‍රය තුළ දැඩි දෝෂ දර්ශනයට ලක් වූයේ මන් දැ යි නිදසුන් ඇසුරෙන් පරීක්ෂා කරන්න.

04. ප්‍රබන්ධකරණයේ දී ආඛ්‍යානය (plot) සහ ගැටුම (conflict) යන සංකල්ප අතර පවතින්නේ කවරාකාර සම්බන්ධයක් දැ යි ඔබට අභිමත කෙටිකථා තුනක් (03) ඇසුරෙන් විග්‍රහ කරන්න.

## <u>'ආ' කොටස</u>

05 බටහිර අධ්‍යාපනය හා ශිෂ්ටාචාරය ආශ්‍රිත ව ගොඩ නගා ගත් දේශපාලනික සංකල්ප ශ්‍රී ලාංකේය දේශපාලන සංස්කෘතිය හා බද්ධ කිරීමට යාමේ දී මාලින් මුහුණ දුන් මානසික ව්‍යාකූලතා <u>'යුගාන්තය'</u> ඇසුරෙන් සාකච්ඡා කරන්න.

06. "සිද්ධි තෝරා ගැනීම පමණක් නොව ඒවා ක්‍රමවත් ව සංවිධානය කිරීම ද ප්‍රබන්ධකරණයේ දී සුවිශේෂ වේ." ගුණදාස අමරසේකරගේ **"කරුමක්කාරයෝ"** නවකථාව ඇසුරෙන් පහදන්න.

07. "ප්‍රේමය, විවාහය සහ ව්‍යාජය යන සංකල්ප අතර දෝලනය වන මිනිස් බැඳීම් පිළිබඳ කෙරෙන අනාවරණයක් **'බල්ලා සමග සරන ලිය'** කෙටිකතාවේ අන්තර්ගත වේ." පරීක්ෂා කරන්න.

08. කෙටිකථාව නමැති ප්‍රබන්ධ ශානරය පනවා ගෙන ඇති සීමා, විවිධ සමාජ ප්‍රපංච පිළිබඳ ගැඹුරු සාකච්ඡාවන් ගොඩනැගීම කෙරෙහි දක්වන බලපෑම කෙබඳු දැ යි **'වහල්ලු'** කෙටිකථා සංග්‍රහයේ ඇතුළත් කෙටිකථා දෙකක් (02) ඇසුරෙන් විග්‍රහ කරන්න.

(එක් පිළිතුරකට ලකුණු 16 බැගිනි)

@@@@@@@@@@